# ගිණුම්කරණය

## 12 ශ්‍රේණිය

## 4.6 වෙළෙඳ භාණ්ඩ ණයට විකිණීම.



Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

## නිපුණතා මට්ටම 4.6 -

## වෙළෙඳ භාණ්ඩ ණයට විකිණීම සම්බන්ධ තොරතුරු පවත්වා ගනියි.

### විකුණුම් ජ'නලය

විකිණීම සඳහා මිලදී ගත් භාණ්ඩ (වෙළෙඳ ද්‍රව්‍ය ) ණයට විකිණීමේදී එම ගනුදෙනු සටහන් කිරීම සඳහා භාවිතා කරන මූලික සටහන් පොත **විකුණුම් ජ'නලයයි.** මෙහිදී විකිණීම ණයට සිදුවිය යුතු අතර වෙළෙඳ ද්‍රව්‍ය විය යුතුය .මෙම ගනුදෙනු සටහන් කිරීමේදී භාවිතා කරන මූලාශ්‍ර ලේඛනය ඉන්වොයිසියයි.

ඉන්වොයිසිය විකුණුම්කරු පිළියෙල කරන අතර **විකුණුම් ඉන්වොයිසිය** ලෙසද හඳුන්වයි. එහි සඳහන් වටිනාකම අඩු කරන වට්ටම **වෙළඳ වට්ටමයි.** වෙළඳ වට්ටම ගිණුම් ගත නොකරන අතර, වට්ටම අඩු කළ ශුද්ධ වටිනාකම මූලික සටහන් පොතෙහි සටහන් කරයි.

<u>එකතු කළ කල අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි නොවූ ආයතනයක විකුණුම් ජ'නලය ආකෘතිය පහත දැක්වේ.</u>

| දිනය | ඉ.අ | ගැනුම්කරු | වටිනාකම | ලෙ.පි |
|---|---|---|---|---|
| 1/2 | 01 | ------ | ****** | |
| 1/5 | 02 | ------ | ******** | |
| 1/31 | | ලෙජරයට පිටපත් කළා | ******* | |

විකුණුම් ජ'නලයේ එකතුව පොදු ලෙජරයට පිටපත් කිරීම සඳහා අදාල ද්විත්ව සටහන වන්නේ

- වෙළෙඳ වෙළඳ ලැබිය යුතු දැ ( ණයගැති පාලන ) හර
- විකුණුම් ගිනුම බැර

අභ්‍යාස 1:-

රෙදි නිෂ්පාදන ව්‍යාපාරයක 2020 ඔක්තෝබර් මාසයේ විකුණුම් පහත දැක්වේ.

10/04 ඉ.අ 12 සුපුල් ටෙක්ස්ටයිල්ස් 70000
10/08 ඉ.අ 13 රුවන් ටෙක්ස්ටයිල් ටෙක්ස්ටයිල් 133000
10/15 ඉ.අ 14 චාමින් ටෙක්ස්ටයිල්ස් 84000
10/28 ඉ.අ 15 කේ.ඩී ටෙක්ස් 44000

- විකුණුම් ජ' නලය පිළියෙල කර ලෙජරයට පිටපත් කරන්න.

සම්පත් දායකත්වය : බස්නාහිර පළාත

සැකසුම : ඒ.එම්,එස්.යු ගුණවර්ධන මිය _ශාන්ත ඇන්ද්‍රෑ මහා විද්‍යාලය - පුත්තලම

Copyright © www.e-thaksalawa.moe.gov.lk

VAT සඳහා ලියාපදිංචි ව්‍යාපාරයක විකුණුම් ජ'නලය පහත දැක්වේ.

| දිනය | ඉ.අ | ගැනුම්කරු | වටිනාකම | VAT | මුළු වටිනාකම | ලෙ.පි |
|---|---|---|---|---|---|---|
| | | පොදු ලෙජරයට පිටපත් කළා | ** | ** | **** | |

**VAT සඳහා ලියාපදිංචි ව්‍යාපාරයක විකුණුම් මත අඩංගු වැට් බද්ද වෙන ම සඳහන් කළ යුතුය.**

එයට අදාල ද්විත්ව සටහන වන්නේ

වෙළඳ ලැබිය යුතු දැ (ණය ගැති පාලන ) ගිනුම හර (VAT සහිත අගය)

- විකුණුම් ගිණුම බැර (VAT රහිත අගය)
- VAT ගිනුම බැර (VAT අගය)

**අභ්‍යාස 2:-**

එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි මරීනා ව්‍යාපාරයේ 2020 ඔක්තෝබර් මස විකුණුම් පහත දැක්වේ.

VAT 8% VAT රහිත අගයන් දී ඇත.

10/02 ඉ.අ 103 පුබුදු ස්ටෝර්ස් 200000

10/08 ඉ.අ 104 නඳුන් ස්ටෝර්ස් 78000

10/23 ඉ.අ 125 දිසානායක ස්ටෝර්ස් 130000

10/30 ඉ.අ 106 පෙරේරා සහ පුත්‍රයෝ 87000

- විකුණුම් ජ'නලය පිළියෙළ කර ලෙජරයට පිටපත් කරන්න.

## ආපසු එවුම් ජ'නලය

ණයට විකුණු භාණ්ඩ ගැනුම්කරු විවිධ හේතු මත ආපසු විකුණුම්කරු වෙත එවිය හැකිය .ඇණවුම් කළ වර්ගයට පටහැනි වීම, ඇණවුම් කළ ප්‍රමාණයට වැඩියෙන් ලැබීම ,කල් ඉකුත් වීම වැනි විවිධ හේතු මේ සඳහා ඉවහල් විය හැකිය .එසේ ආපසු එවුම් සටහන් කිරීම සඳහා ආපසු එවුම් ජ'නලය මූලික සටහන් පොත ලෙස භාවිතා කරන අතර මූලාශ්‍ර ලේඛනය බැරපත වේ.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

<u>එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි නොවූ ව්‍යාපාරයක ආපසු එවුම් ජ'නලය හා අදාළ ද්විත්ව සටහන හා ආකෘතිය පහත දැක්වේ.</u>

- ආපසු එවුම් ගිනුම හර
- වෙළෙඳ ලැබිය යුතු දෑ (ණයගැති පාලන ගිණුම) බැර

| දිනය | බැරපත් අං. | ගැනුම්කරු | වටිනාකම | ලෙ.පි |
|---|---|---|---|---|
| | | පොදු ලෙජරයට පිටපත් කළා....... | ******* | |

**අභ්‍යාස 3 :-**

රෙදි නිෂ්පාදන ව්‍යාපාරයක ආපසු එවුම් පහත දැක්වේ.

- බැරපත් අංක 12 රුවන් ටෙක්ස්ටයිල්ස් 15000
- බැරපත් අංක 33 කේ.ඩී ටෙක්ස් 6000

ආපසු එවුම් ජ'නලය පිළියෙල කර ලෙජරයට පිටපත් කරන්න.

<u>එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි ව්‍යාපාරයක ආපසු එවුම් ජ'නලය පහත දැක්වේ.</u>

| දිනය | බැරපත් අං. | ගැනුම්කරු | වටිනාකම | VAT | මුළු වටිනාකම | ලෙ.පි |
|---|---|---|---|---|---|---|
| | | පොදු ලෙජරයට පිටපත් කළා... | ***** | **** | ***** | |

- ආපසු එවුම් ගිණුම හර (වැට් රහිත අගය)
- Vat .ගිනුම - හර (වැට් අගය)
- වෙළඳ ලැබිය යුතු දෑ දෑ (ණයගැති පාලන ගිණුම) බැර (වැට් සහිත අගය)


Copyright© www.e-thaksalawa.moe.gov.lk

අභ්‍යාස 4:-

එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි මරීනා ව්‍යාපාරයේ 2020 ඔක්තෝබර් මස ආපසු එවුම් පහත දැක්වේ.

(වැට් 8% වැට් රහිත අගයන් වේ)

| | | | |
|---|---|---|---|
| 10/05 | බැරපත් අංක 43 | පුබුදු ස්ටෝස් | 20000 |
| 10/25 | බැරපත් අංක 44 දි | දිසානායක ස්ටෝර්ස් | 35000 |

- ආපසු එවුම් ජ'නලය පිළියෙල කර ලෙජරයට පිටපත් කරන්න.


Copyright © www.e-thaksalawa.moe.gov.lk